සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) පැරණි ගිවිසුමේ සඳහන් වන යාච්ඤා පොත වන්නේ,
(1) ප්‍රේම ගී (2) ගීතාවලිය
(3) හිතෝපදේශය (4) විලාප ගී

(02) අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයෙහි අප විසින් විශ්වාස කළයුතු සත්‍යතා කීයක් අඩංගු වේ ද?
(1) 10 (2) 06 (3) 07 (4) 12

(03) ජේසුස් වහන්සේගේ මාංශගත වීම සිහිපත් කරන යාච්ඤාව වන්නේ,
(1) නමෝ මරිය (2) මංගල්‍යය ආරාධනාව
(3) තුන්කාලේ ආරාධනාව (4) ත්‍රිත්ව ස්තෝත්‍රය

(04) ශුද්ධවන්තයන් අතර උසස් ම ගෞරවය හිමිවන්නේ,
(1) ශුද්ධ වූ මිඛායෙල් අග්‍රදූතයාට (2) ශුද්ධ වූ ජුසේ තුමාට
(3) මරිය තුමියට (4) ශුද්ධ වූ පේදුරු තුමාට

(05) අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ අපෝස්තුළුවරුන් සමග යාච්ඤාව සඳහා වැඩම කළේ,
(1) සේනාකුළු ශාලාවට (2) ඔලීව කන්දට
(3) සීනයි කන්දට (4) ජෙරුසලම් දේවමාළිගයට

(06) පාස්කු අභිරහස ලෙස හඳුන්වන්නේ,
(1) ජේසුස් වහන්සේගේ දුක්විඳීම, මරණය, උත්ථානය
(2) ජේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබීම
(3) ජේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අනුහසින් ඉපදීම
(4) ජේසුස් වහන්සේ දේව බලයෙන් ප්‍රාතිහාර්ය කිරීම

(07) ණය මංගල්‍යය දිනයකි.
(1) මරියතුමියගේ උපන් දිනය (2) දේව දයාවේ මංගල්‍යය
(3) දේවස්ථානයේ මුනිවරයාගේ මංගල්‍යය (4) සෑම ඉරුදිනක් ම



Department of Education - Western Province

(08) පස්වන දේව පණතට විරුද්ධ ක්‍රියාවක් වන්නේ,

(1) සොරකම් කිරීම

(2) ශරීර සෞඛ්‍යයට අහිතකර ආහාර ගැනීම

(3) පොදු දේපල විනාශ කිරීම

(4) වැරදි තීන්දු ලබා දීම

(09) කිතු දහමේ මූලික ඉගැන්වීමකි.

(1) සාන්තුවරයන්ට ද නමස්කාර, වන්දනා කිරීම

(2) දේව ප්‍රේමය පදනම් කරගනිමින් අසල්වැසියන්ට ප්‍රේම කිරීම

(3) රූප වන්දනාව කිරීම

(4) අන්‍ය ආගමික වත්පිළිවෙත් වලට එකමුතු වීම

(10) සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන වන්නේ,

(1) පූජකවරය, අභිවෘද්ධි ආලේපය

(2) දිව්‍ය සත්ප්‍රසාදය, ආශිර්වාදකාර බන්ධනය

(3) ආශිර්වාදකාර බන්ධනය, පූජකවරය

(4) ප්‍රසාද ස්නාපනය, පූජකවරය

(11) ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන ශුද්ධ වූ තෛලයෙන් සංකේතවත් වන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේගේ ආලෝකය

(2) ශුද්ධාත්ම වරම් ලැබීම

(3) වරප්‍රසාදීය ජීවිතයක් ලැබීම

(4) ආත්මික පිරිසිදුකම

(12) ඉතාලියේ ලන්චියානෝ නුවර ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමාට කැප කරන ලද දෙව්මැදුරේ සිදු වූ ප්‍රාතිහාර්යය මගින් ප්‍රකාශ වූයේ,

(1) ජේසුස් වහන්සේගේ ශ්‍රී මුහුණ ය.

(2) දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩසිටින ජේසුස් වහන්සේ ය.

(3) ජපමාලය අතෙහි දරා සිටින දේව මාතාවන් ය.

(4) අපගේ ගැලවීමේ සංකේතය වන කුරුසිය ය.

(13) 2017 වර්ෂය කැපකර ඇත්තේ,

(1) දිව්‍ය සත්ප්‍රසාදීය ජේසු සමිදාණන්ට

(2) මරිය මාතාවන්ට

(3) සාන්ත ජුසේවාස් මුනිතුමාට

(4) භාග්‍යවන්ත තෙරේසා මව්තුමියට

(14) ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රශංසාත්මක පැතුමක් වන්නේ,

(1) අයහපතින් අප මුදාගත මැනව.

(2) අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව.

(3) ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා.

(4) පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී

Department of Education – Western Province

(15) කිතුනු අපගේ ජීවිතයේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,

(1) දේව ප්‍රසාද නිධාන (2) දිව්‍ය පූජාව

(3) ශුද්ධ බයිබලය (4) යාච්ඤාව

(16) ශුද්ධ වූ මතෙව්, ශුද්ධ වූ ලූක්, ශුද්ධ වූ ජොහන් හා ශුද්ධ වූ මාක් ශුභාරංචිවල සංකේත වන්නේ පිළිවෙලින්,

(1) මිනිසා / ගවයා / රාජාලියා / සිංහයා

(2) ගවයා / සිංහයා / රාජාලියා / මිනිසා

(3) සිංහයා / මිනිසා / ගවයා / රාජාලියා

(4) රාජාලියා / සිංහයා / මිනිසා / ගවයා

(17) දෙවියන් වහන්සේ මැවූ මැවිලි අතරින් උතුම්ම මැවිල්ල වනුයේ

(1) දේව දූතයන් ය. (2) මිනිසා ය.

(3) අසිරිමත් පරිසරය හා සතුන් ය. (4) ඉහත සියලු දේ ය.

(18) ජේසුස් වහන්සේ මෙලොවට පැමිණියේ,

(1) ගැලවීමේ කාර්යය ක්‍රියාත්මක කිරීමට ය.

(2) දිවැස් වැකි සම්පූර්ණ කිරීමට ය.

(3) දේව බලය ප්‍රකාශ කිරීමට ය.

(4) අප හා සමාන මනුෂයෙකු වීමට ය.

(19) දාවිත්ගේ නුවර නමින් හඳුන්වන්නේ,

(1) රෝමය (2) ජෙරුසලම

(3) නාසරෙත් (4) බෙත්ලෙහෙම

(20) 'ස්වාමීන් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව' මෙම වදන් කා විසින් කා හට කියන ලද්දේ ද?

(1) ජේසුස් වහන්සේ විසින් දෙවි පියාණන් වහන්සේට

(2) මරිය මාතාවන් විසින් ජේසුස් වහන්සේට

(3) ශුද්ධ වූ ස්තේපන් තුමා විසින් දෙවියන් වහන්සේට

(4) මෝසෙස් තුමා විසින් දෙවියන් වහන්සේට

Department of Education – Western Province

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

(01) ඔබ පංති කාමරයේ කළ ක්‍රියාකාරකම ඇසුරෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර ලියන්න.

(1) යාච්ඤාව යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(2) යාච්ඤා වර්ග 2ක් නම් කරන්න. (ලකුණු 04)

(3) දෙවිපියාණන් වහන්සේ හමුවේ නොකඩවා, අධෛර්යට පත් නොවී යාච්ඤා කළයුතු බව පෙන්වා දීමට ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමා කතා 2ක් නම් කරන්න. (ලකුණු 04)

(4) යාච්ඤා කිරීමේ දී අප විසින් සැලකිල්ලට ගත යුතු කරුණු 2ක් ලියන්න. (ලකුණු 04)

(5) ශු. සභාවේ නිල යාච්ඤා (පොදු යැදුම්) 2ක් නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 16)

(02) (1) ශුද්ධ වූ සභාවේ මාතාව වන මරිය තුමියට ගෞරව කරන ආකාර 2ක් ලියන්න.

(2) මරිය තුමියගේ ජීවිතයේ කැපී පෙනෙන කිතුනු ගුණාංග 3ක් නම් කරන්න.

(3) දෙවිපියාණන් වහන්සේට ප්‍රසන්න දරුවෙකු ලෙස ගොඩනැගීම සඳහා ඔබ විසින් අනිවාර්යයෙන් කළයුතු දේවල් 5ක් ලියන්න. (ලකුණු 2 + 3 + 6 =11)

(03) (1) සතුරන්ට ප්‍රේම කිරීම ගැන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් 2ක් ලියන්න.

(2) ජේසුස් වහන්සේගේ ආදරයට හා කරුණාවට පාත්‍ර වූ පුද්ගලයන් තිදෙනෙක් නම් කරන්න.

(3) පහත අවස්ථා වල දී ඔබට ගත හැකි ක්‍රියා මාර්ග 2 බැගින් ලියන්න.

(අ) ඔබේ මිතුරෙකු ඔබට විරුද්ධව චෝදනාවක් කළ විට

(ආ) දේවස්ථාන භූමියේ දී ඔබ මුදල් පසුම්බියක් ඇහුලූ විට

(ඉ) ඔබේ මව අසනීපයෙන් පසුවන විට (ලකුණු 2 + 3 + 6 =11)

(04) (1) ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද (පණත්) 2ක් ලියන්න.

(2) සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලැබීමෙන් ඔබ ලැබෙන වරප්‍රසාද 3ක් ලියන්න.

(3) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අර්ථවත්ව ලබා ගැනීමට ඔබ කරන දේවල් 5ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6 =11)

(05) (1) දේව මැවිල්ල වර්ධනය කිරීම සඳහා ඔබට කළහැකි දේවල් 2ක් ලියන්න.

(2) අද මිනිසා දේව මැවිල්ල ආරක්ෂා කිරීමට අපොහොසත් වීමෙන් පැන නැගී ඇති ප්‍රශ්න 3ක් ලියන්න.

(3) ඔබ ලබා ඇති උතුම් මිනිස් ජීවිතයට ස්තුති කර යාච්ඤාවක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6 =11)

(06) (1) ශුද්ධ බයිබලය කියවීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

(2) ඔබ කැමති නව ගිවිසුමේ ශුභාරංචි කතුවරයෙක් ගැන වාක්‍ය 3ක් ලියන්න.

(3) ඉරුදින ශුද්ධ ලෙස හා ධර්මිෂ්ඨ ලෙස ගත කිරීමට ඔබ කරන දේවල් 5ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6 =11)

(07) (1) පළමු හා දෙවන දේව පණත් නම් කරන්න.

(2) අසල්වැසියාට ප්‍රේමය දැක්වීම ගැන කියැවෙන පහත පණත් පිළිපැදීමට ඔබට කළහැකි ක්‍රියාවක් බැගින් ලියන්න.

(අ) 4 පණත

(ආ) 7 පණත

(ඉ) 8 පණත

(3) දෙවිපියාණන් වහන්සේ අද ඔබට කතා කරන ආකාර 5ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6 =11)

Department of Education – Western Province